38

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2015/2016

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 ජුනි/ ජූලි)

## BLE 105 - නෛතික පරිසරය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.
අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩුකෙරේ.

(2) කාලය පැය තුනයි.(03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ..

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1) i. ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ ධුරාවලිය තුළ උත්තරීතර, අවසානාත්මක සහ ලේඛනෝපගත කිරීමේ ජ්‍යෙෂ්ඨතම අධිකරණය කුමක්දැයි හඳුන්වාදී එම අධිකරණ සතු අධිකරණ බලතල කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ මහාධිකරණ විසින් අපරාධ අධිකරණ බලතල, සිවිල් අධිකරණ බලතල මෙන්ම වාණිජ්‍ය අධිකරණ බලතල ද ක්‍රියාත්මක කරනු ලැබේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

2) i. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රෝම ලන්දේසි නීතියේ මුලාශ්‍ර මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ රෝම ලන්දේසි නීතියට හිමි වී ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

3) i. අමිත් සහ ගයනි 1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ආඥා පනත යටතේ විවාහ වී අතර කුමාරි නමැති කාන්තාව සමඟ අනියම් ප්‍රේම සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි. අමිත් සහ ගයනිගේ විවාහය පවතින අතරතුර දී , අමිත්ට කුමාරි සමඟ මුස්ලිම් නීතිය යටතේ නැවත විවාහ විය හැකිද? උක්ත අවස්ථාවට අදාළ වන නෛතික තත්වය විස්තර කරන්න.

(ලකුණු 10)

ii. ඉස්ලාම් ආගමික යුවලක් වන රිස්වාන් සහ ෆාතිමාට දරුවන් නොමැති බැවින් අංක 1941 දරුකමට හදා ගැනීමේ ආඥා පනත අකාරව මොහොමඩ් රාසික් නමැති දරුවා දරුකමට ලබා ගත් අතර පසු කලෙක අන්තිම කැමති පත්‍රයක් නොතබා එම යුවල මියගොස් ඇත. තම දෙමාපියන්ගේ අන්තිම කැමති පත්‍රයක් රහිත දේපල සඳහා තමා හට හිමිකමක් තිබේ දැයි මොහොමඩ් රාසික් විමසා සිටියි. මොහොමඩ් රාසික්ට නෛතික උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

4) i. ඉංග්‍රීසි පොදු නීති ආභාෂය සහිත, අධිකරණ පද්ධතියක් තුළ අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය අදාළ කර ගැනීමේදී දක්නට ලැබෙන ප්‍රධානතම ලක්ෂණය වනුයේ; "ඉහළ අධිකරණයක් විසින් පූර්වයේ ලබා දුන් නඩු තීරණයකින් පහළ අධිකරණයක් අනුගම්‍ය ලෙස බැඳී සිටීම වේ. එනමුත් ඇතැම් අවස්ථාවලදී ඉහළ අධිකරණයක් විසින් ලබාදුන් පූර්ව නඩු තීන්දුවක් අනුගමනය නොකිරීමට ද පහළ අධිකරණයකට හැකියාවක් ඇත. උක්ත ප්‍රකාශයට අදාලව අදහස් දක්වන්න.

(ලකුණු 10)

ii. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර තිබෙන වර්තමාන ශ්‍රේෂ්ඨාධිකරණය 1971 ට පෙර රාජාධිකරණය මගින් ලබාදුන් නඩු තීරණයකින් සහ 1974 – 1978 කාලසීමාව තුළදී ස්ථාපිතව පැවති ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබාදුන් නඩු තීරණයකින් බැඳී සිටින්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

5) i. තේසවලමෙයි නීතියේ මූලාශ්‍ර කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. 1806 අංක 18 දරන තේසවලමෙයි රෙගුලාසියෙන් දෙවන වගන්තියට අනුව "තේසවලමෙයි හෙවත් 1706 දී සයිමන්ස් ආණ්ඩුකාරවරයාගේ විධානය පරිදි ඒකරාශි කරන ලද යාපනය පළාතේ මලබාර් වාසියකයන්ගේ සිරිත් පූර්ණ බලධාරී වන්නා සේ සැලකිය යුතුය. " මෙම විධිවිධානය කෙරෙහි අවධානය යොමු කරමින් තේසවලමෙයි නීතිය අදාළ වන්නේ කවුරුන් හටදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

6) i. සිරිතක් නෛතික බලධාරී වීම සඳහා ඉංග්‍රීසි නීතිය තුළ සහ රෝම ලන්දේසි නීතිය තුළ සලකා බලනු ලබන අවශ්‍යතා කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. දේශීය චාරිත්‍රයක් නෛතික බලධාරී වීම සඳහ ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් සළකා බලනු ලබන නිර්නායක විස්තර කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

7) (අ) .i. බණ්ඩාර උඩරට සිංහල තැනැත්තෙක් වන අතර පහතරට සිංහල කාන්තාවක් වන ශ්‍රියානි සමග 1940 දී උඩරට නීතිය යටතේ විවාහ වූ අතර විවාහයෙන් පසුව ශ්‍රියානි උඩරට පිහිටි බණ්ඩාරගේ මහ ගෙදර පදිංචි වූවාය. එම යුවළට දාව දමිත් සහ කමල් නැමති පුතුන් දෙදෙනෙක් සිටින අතර ඔවුනට උඩරට නීතිය අදාල වේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. උඩරට සිංහලයන් වන කළු අප්පු සහ පොඩි මැණිකේ 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනත යටතේ 1970 දී විවාහ වී ඇත. ඔවුන් විසින් උඩරට ප්‍රදේශයේ පිහිටි වගාකළ තේ අක්කර දෙකක් සහ වගාකළ කෝපි අක්කරයක්ද මිලදී ගෙන ඇති අතර ඔවුන් සතු එම දේපළවලට අදාල වන නෛතික තත්ත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) 1815 දී උඩරට රාජධානිය, බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතට පත්වීමෙන් පසුව එතෙක් ප්‍රාදේශීය නීතියක්ව පැවති උඩරට නීතිය පුද්ගල නීතියක් දක්වා පරිවර්තනය වී ඇත.

උක්ත ප්‍රකාශය සමග ඔබ එකඟද? ඔබගේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

8). දකුණු අප්‍රිකානු නීතී රචකයින් දෙපලක් වන හාලෝ සහ ඛාන් ඉංග්‍රීසි නීතිය දකුණු අප්‍රිකානු නීති පද්ධතියට ප්‍රවේශ වූ ආකාරය පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි. "රාජකීය කොමිෂන් සභාවල සහ ප්‍රසිද්ධ සාකච්ඡාවල තූර්ය වාදන හඩ මැද්දේ ව්‍යවස්ථා සම්පාදනය නැමති රජ මාවත ඔස්සේ සමහර ඉංග්‍රීසි නීති සිද්ධාන්ත අපගේ නීති පද්ධතියට ප්‍රසිද්ධියේ ප්‍රවේශ වූ අතර ඇතැම් නීති සිද්ධාන්ත නිහඬව සහ හොර රහසේම අතුරු පාරවල් සහ අඩිපාර ඔස්සේ අපගේ නීති පද්ධතියට ප්‍රවේශ වී ඇත."

උක්ත ප්‍රකාශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඉංග්‍රීසි නීතිය ප්‍රවේශ වූ ආකාරය පැහැදිලි කරන්න..

**(ලකුණු 20)**

***********